
# සමගිය බලය වේ.



දෙසඳි චිරන්යා නවරත්න

කෘතියේ නම :

සමගිය බලය වේ

කතෘගේ නම :

දෙසඳි චිරන්යා නවරත්න

කතෘගේ වෙනත් කෘති :

සතුටු ගෙදර

කෘතිය පළකරන දිනය :

2025.02.08

987-624-208-417-6

## පිදුම

ආදරයෙන් කවා පොවා ඇති දැඩි කල මාගේ දෙමව්පියන්ටද කථාව ගොඩනැගීමට සහය දුන් මාගේ සොහොයුරයාටද මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිනිය ඇතුළු සියළුම ගුරු මණ්ඩලයටද මාගේ කෘතිය නමස්කාර පූර්වකව පුද කර සිටිමි.

## පෙර වදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදී කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත


යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම සහජ කුසලතාවය හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

# සමඟිය බලය වේ.

එකමත් එක කැලයක අලි රංචුවක් සිටියා. අලි රංචුවේ නායකයා පැවසූ දේවල් සමහර අය පිළිගත් අතර, සමහර අය නොපිළිගත්හ.


වැඩි දෙනෙක් සිටියේ අවවාද නොපිළිගන්නා කණ්ඩායමේය.



එක් දිනක් අලි රංචුව ගමන් කරන විට අලි රංචුවේ නායකයා මෙසේ පැවසූහ. “මෙම ප්‍රදේශයේ දඩයම් කරුවන් සිටින බැවින් ප්‍රවේශම් වන්න” නැතිනම් ඔබලා ඉක්මනටම අනතුරකට පත් වේ.




අලි රංචුවේ සමහට අය එය අසා ප්‍රවේශම් වූන අතර, සමහර අය නොඅසා තැනින් තැන විසිර ගියහ. අලි රංචුවේ නායකයා පැවසූ දේ නොඇසූ අලි පිරිස තැනින් තැන ගමන් කරන විට දඩයම් කරුවෙකු ඔවුන්ව අල්ලා ගත්හ.




අලි රංචුවේ නායකයා සමග අනෙකුත් අලි පිරිස ඔවුන්ව සෙවුවාය. එම විට ඔවුන්ගේ අඩි සලකුණු දුටුවාය. ඔවුන් අඩි සලකුණු දිගේ ගියහ. ඔවුන් ගමන් කරන විට ඔවුන්ට නිවසක් හමුවිය.




අලි රංචුව නිවස අවට සෝදිසි කරන විට අලි රංචුවේ අනෙක් අලි පිරිස කූඩුවක දමා ඇති අයුරු දැක්කෝය. කූඩුව ඇතුලේ සිටි අලි කණ්ඩායම මහත් බියටත් නොසන්සුන්තාවයටත් පත් වූහ.




අලි රංචුවේ නායකයා දඬයම් කරුවා නොසිටි නිසා තමාගේ බලය සහ අනෙක් අලියන්ගේ බලය යොදාගෙන කූඩුව කැඩුවෝය. ඔවුන් ඉන් පසුව ඉක්මණට එතනින් ගියහ.




ඉන් පසුව අලි රංචුවේ නායකයා පැවසූ දේවල් සෑම අලියෙක්ම පිළිගත්හ. අලි රංචුව නැවතත් කෑම සොයමින් කැලේ ඇවිද්දා.



දඩයම්කරු නැවතත් උගුලක් අටවා තිබුණි. නමුත් අලි රංචුවේ නායකයා පැවසූ දේවල් සෑම අලියෙක්ම ඇසූ නිසා එම උගුලින් බේරුණා.



ඔවුන් සවස් වන විට ආහාරද රැගෙන ඔවුන් සිටි ස්ථානයට ගියහ. එම නිසා අලි රංචුව සමඟියෙන් හා සතුටින් ජීවත් වුණා.



ඉතින් දැක්කනෙ යාළුවේ අසමඟියෙන් ජීවත් වන විට බොහෝ කරදරවලට අපට මුහුණ දෙන්න සිදු වෙනවා. නමුත් සමගියෙන් ජීවත් වන විට අපට එන කරදර පහසුවෙන් ජය ගැනීමට හැකි වේ. අපිත් සමඟියෙන් ජීවත් වෙමු.

අවසානයි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අපලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මූලිවීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛන්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර

තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදිශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුයි.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතායට එක්වීමත් සමගම දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුල විවිධ ගැටලු ප්‍රශ්න නිරමාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම

ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගාදී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිස පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධකාරක
සෙනවිරත්න මහලේකම්